# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලයශාලාව

# ඇබෑර්තු

## ප්‍රධාන ගණකාධිකාරී තනතුර

### ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් සහ පළපුරුද්ද :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ගණකාධිකරණය පිළිබඳ උපාධියක්

**සහ**

පිළිගත් ගණකාධිකරණය පිළිබඳ වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය

**සහ**

සමාන තත්ත්වයේ වසර 10ක පළපුරුද්ද

**සහ**

අදාළ ක්ෂේත්‍රය සඳහා මාස්ටර්ස් උපාධියක් ලබා තිබීම අමතර සුදුසුකමක් වේ.

**වයස :** අයදුම්කරුවන් වයස අවුරුදු 50ට අඩු අයවලුන් විය යුතුය. (වයස අවුරුදු 50ට අඩු අපේක්ෂකයන් නොමැති විටදී වයස අවුරුදු 50ට වැඩි නමුත් අවුරුදු 55ට අඩු අයවලුන් සලකා බලනු ලැබේ.)

**වැටුප් පරිමාණය :** SL 1 ශ්‍රේණිය 1

රු. 179,870 -16X5250-263,870/- මාසිකව

**රැකියා පැතිකඩ :** මෙම තනතුර සඳහා ප්‍රතිඵල දිශානත, ආත්ම විශ්වාසය සහිත පුද්ගලයකු විය යුතු අතර, රෝහලේ මූල්‍ය කටයුතු භාරව කටයුතු කළ යුතු අතර, ගිණුම්කරණය අයවැය පිළියෙළ කිරීම, මූල්‍ය සැලසුම්කරණය සහ කළමනාකරණය හා ගබඩා කළමනාකරණය සඳහා වගකීම් දැරිය යුතුය.

**රැකියාවේ නියුක්ත කිරීමේ නියමයන් :** ස්ථිරයි සහ අර්ථ සාධක අරමුදල් සඳහා හිමිකම් සහිතයි.

රාජ්‍ය සේවයේ තනතුරක් දරන අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් ඔවුන් සේවය කරන ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතු අතර, පිටපතක් සෘජුව ඉදිරිපත් කළයුතුය.

පත්වීම සඳහා අපේක්ෂකයා තෝරාගනු ලැබුවහොත් ඔහු /ඇය සේවයෙන් මුදා හැරීමට හැකි බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් අයදුම්පතට අමුණා එවිය යුතුය.

පත්වීම් සිදු කිරීම / නොසිදුකිරීම සම්බන්ධයෙන් තීරණය ගැනීමේ සම්පූර්ණ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලයශාලාවේ පාලක සභාව සතුය. අයදුම් කරන තනතුර අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. අයදුම්කරුවන් සම්පූර්ණ ජීවදත්ත සහිත ඔවුන්ගේ අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනකුගේ (02) නම් සහිතව 2026 සැප්තැම්බර් 21 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් අය වෙත ලැබෙන්නට සැළැස්විය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලයශාලාව, තලපත්පිටිය, නුගේගොඩ.**
**2026 සැප්තැම්බර් 03 දින**

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED